**07 කාලච්ඡේදය**

නව යොවුන්විය ලෙස අවුරුදු 10-19 අතර වයස් කාලය හැඳින්විය හැක.මෙය සංක්‍රාන්තික සමය,කුණාටු සමය යන විවිධ නම්වලින් හැඳින්වෙන මෙම අවධිය තුළ දරුවන්ගේ ස්ත්‍රී, පුරුෂ වශයෙන් වෙනස්කම් රාශියක් සිදු වේ.

i. නව යොවුන්වියේ දී දරුවන්ගේ ඇතිවන කායික,මානසික,සමාජීය ලක්ෂණ දෙක බැගින් ලියන්න.
ii. ද්විතීක ලිංගික ලක්ෂණ පහළ වීම සඳහා බලපාන හෝමෝන දෙකක් සඳහන් කරන්න.
iii. යොවුන් වියට මුහුණ දීමේ දී කායික,මානසික,සමාජීය සූදානම සඳහා ඔබ වර්ධනය කළ යුතු නිපුණතා දෙක බැගින් ලියන්න.

**08 කාලච්ඡේදය**

ප්‍රජනක සෞඛ්‍යය කෙරෙහි සෞඛ්‍යවත් චර්යා,සහචර බලපෑම,අයහපත් ලිංගික චර්යා,හෝමෝන ආදිය බලපායි.

i. ප්‍රජනක සෞඛ්‍යය යහපත්ව පවත්වා නොගැනීම මගින් ඇතිවිය හැකි අහිතකර තත්ත්වයන් හතරක් සඳහන් කරන්න.
ii. ප්‍රජනක පද්ධතිය පිළිබඳ සමාජයේ ඇති මිථ්‍යා මතයන් දෙකක් ලියන්න.
iii. ප්‍රජනක සෞඛ්‍ය කෙරෙහි බලපාන සාධක දෙකක් කෙටියෙන් පහදන්න.